# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**

**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/ER/09- 2020- ගෘහ ආර්ථික | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2020.10.27 |

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරී,

**<u>ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ</u>**
**<u>ජාතික ගෙවතු වගා වැඩසටහන - 2020/21 මහ කන්නය</u>**

ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් 2020.10.23 දින පැවති රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාලව පහත සඳහන් මඟපෙන්වීම් ඔබ වෙත ලබාදෙන බව කාරුණිකව දන්වමි.

02. ග්‍රාමීය කමිටුවේ නිලධාරීන් විසින් හඳුනාගත් ගෘහ ඒකක වෙත බීජ සහ තවාන් පැල ලබාදීමට සමගාමීව අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතන මඟින් ලබාදීමට සැලසුම් කර ඇති යෙදවුම් ඉදිරි මාස 02 තුළදී කඩිනමින් සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබාදිය යුතුව ඇත. එබැවින් මාගේ සමාංක හා 2020.10.06 දිනැති ලිපිය සමඟ ඔබ වෙත දැනටමත් ලබාදී ඇති ආකෘති ප්‍රකාරව පහත සඳහන් ආයතන වලට අදාලව යෙදවුම් අවශ්‍යතාවයේ සාරාංශ වාර්තාව 2020.11.02 දිනට පෙර එම ආයතනයන් සහ ජීවනෝපාය සංවර්ධන අංශය වෙත විද්‍යුත් තැපැල් ලිපිනයන් ඔස්සේ ලබාදිය යුතුව ඇත. මෙම යෙදවුම් අවශ්‍යතාවයන් සඳහා වන ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුත්තේ දිස්ත්‍රික් මට්ටමින් බැවින් මෙය අත්‍යාවශ්‍ය හා ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
- ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.
- ආයුර්වේද දෙපාර්තමේන්තුව.
- පොල් වගා කිරීමේ මණ්ඩලය

03. මීට අමතරව ගෙවත්තක් සඳහා උපරිමව පොල් පැල 02 ක් ලබාදීමට හැකියාවක් පවතින බැවින් ගෙවත්තේ පවතින ඉඩ පහසුකම් පිළිබඳව අවධානය යොමු කර දිස්ත්‍රික් පොල් පැල අවශ්‍යතාවය ද මේ සමඟ ඇති ඇමුණුමට අනුව 2020.11.02 දිනට පෙර එවන මෙන් දන්වමි.

D/jeev/Sen/2020 Letter/Sen.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

04. ඉහත සඳහන් කරන ලද ආයතන වලින් ලබාදෙන යෙදවුම් සඳහා සුදුසු ගෘහ ඒකක හඳුනාගැනීමේදී සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ ග්‍රාම නිලධාරී හඳුනාගත් ගෙවතු වලට අදාලව යෙදවුම් අවශ්‍යතාවය පිළිබඳව තොරතුරු ලබාදීම ප්‍රමාණවත් වනු ඇත. එමෙන්ම ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ ගරු සභාපති විසින් අවධාරණය කළ පරිදි ග්‍රාමීය කමිටුවේ අනෙකුත් නිලධාරීන්ගේ ලේඛණවලට සමෘද්ධිලාභීන් ඇතුලත්ව ඇත්නම් එම ගෘහ ඒකක සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ ලේඛණයට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස වැඩිදුරටත් දන්වමි.

05. මෙම ආයතනය මඟින් හඳුනාගත් ගෘහ ආර්ථික ඒකක වෙත මෙම යෙදවුම් ලබාදෙනුයේ වාණිජමය ඉලක්ක සපුරා ගැනීමට නොව හුදෙක්ම ඔවුන්ගේ ගෘහ ආර්ථික මට්ටම වර්ධනය කරදීමට බැවින් බැවින් වාණිජමය වශයෙන් සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතින පවුල් සිටී නම් එම තොරතුරු ලබාගෙන ඒ ඒ ආයතන වලට අදාලව රාජකාරී කටයුතු කරන ප්‍රාදේශීය නිලධාරීන් සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට වැදගත් වේ.

06. ඉදිරි වසර වලදී ද මෙම ගෘහ ආර්ථික ඒකක සංවර්ධනය කිරීමේ වැඩසටහන තිරසර ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය බැවින් මෙම කන්නයේ ලබාදෙන බීජ මඟින් ලැබෙන අස්වනු වලින් කොටස් ඊළඟ කන්නය සඳහා වගා කිරීමට සුරක්ෂිතව ගබඩාකර තබා ගන්නා ලෙස ගෙවතු හිමියන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම සුදුසු වේ.

07. ග්‍රාම නිලධාරී වසම වෙත ලබාදෙනුයේ සීමා සහිත බීජ ප්‍රමාණයක් බැවින් ඉතිරි බීජ අවශ්‍යතාවය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ බීජ බැංකු මඟින් ගෘහ ඒකක වෙත ලබාදීමට හැකි බව ගොවිජන සේවා කොමසාරිස් විසින් උක්ත රැස්වීමේදී දන්වන ලදී. ඒ අනුව මෙම බීජ බැංකු සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බීජ අලෙවිසැල් මඟින් අවශ්‍ය ඉතිරි බීජ ප්‍රමාණය සපුරාගත හැකි වනු ඇත. එමෙන්ම ඉදිරියේදී මෙම හඳුනාගත් පැල තවාන් හිමියන් ව්‍යවසායකයෙකු ලෙස වර්ධනය කරමින් ඉදිරි කන්න වලදී ග්‍රාම නිලධාරී වසමේ පැල හා බීජ අවශ්‍යතාවය ඔවුන් තුලින් සපයා ගැනීම වඩාත් ඵලදායී බැවින් මේ සඳහා එම තවාන් හිමියන්ට අවශ්‍ය සහන සැලසාදීමට ඔවුන්ගේ ඉදිරි අවශ්‍යතාවයන් හඳුනාගන්නා ලෙස ද දන්වනු කැමැත්තෙමි.

08. මෙම මහ කන්නයේදී ගෘහ ඒකක සංවර්ධන වැඩසටහන යටතේ යෙදවුම් ලබාදීමේදී ප්‍රදේශයේ සියළු මහජන නියෝජිතයින් දැනුවත් කර එම කටයුතු සිදු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
2. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. අධ්‍යක්ෂ ජනරාල් - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. අධ්‍යක්ෂ ජනරාල් - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි.
8. කොමසාරිස් - ආයුර්වේද දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
9. සභාපති - පොල් වගා කිරීමේ මණ්ඩලය - කා.දැ.ගැ.පි.
10. ප්‍රධාන ගණකාධිකාරී - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.